2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගම්පහ

වැය ශීර්ෂ අංකය - 256

පටුන

1. **ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

1.1 හැඳින්වීම 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 2

1.3 ප්‍රධාන කාර්යයන් 3

1.4 සංවිධාන සටහන 4

1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5

2. **ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

විශේෂ, ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක 6 - 7

3. **වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 8 - 9

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 10 - 11

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 11 - 12

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන් 13 - 23

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 24

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 25

3.8 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 26 - 28

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 29

3.10 විගණකාධිපතිගේ වාර්තාව 30 - 40

4. **කාර්ය සාධන දර්ශක**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව) 41

5. **තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු 42 - 45

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 45 - 46

6. **මානව සම්පත් පැතිකඩ**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 47

6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම 47 - 48

6.3 මානව සම්පත් සංවර්ධනය 48 - 50

7. **අනුකූලතා වාර්තාව** 51 - 57

1. ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ගම්පහ දිස්ත්‍රික්කය, පරිපාලන දිස්ත්‍රික් පනතේ 3 වන ඡේදය යටතේ 1978 සැප්තැම්බර් මස 07 වන දින ගැසට් නිවේදනය මඟින් නව දිස්ත්‍රික්කයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිණි. මෙය කොළඹ දිස්ත්‍රික්කය නැවත බෙදීමෙන් වෙන්කරන ලද පාලන ප්‍රදේශයකි. ගම්පහ බැණ්ඩියමුල්ලේ පිහිටි අග්‍රා ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යනු ලබන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මූලස්ථානය කොටගත් උතුරින් මා ඔයෙන් ද (කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක) නැගෙනහිරින් මීටර 100-200 උසකින් ද විහිදී යන වැටි හා නිම්නවලින් ද (කෑගල්ල දිස්ත්‍රික්කය) දකුණින් කැලණි ගඟ මායිම් වන කොළඹ දිස්ත්‍රික්කයෙන් ද, බටහිර ඉන්දියන් සාගරයෙන් ද, මායිම් වූ කිලෝ මීටර 45 දිගින් හා පළලින් යුත් හතරැස් බිම් කඩක් වශයෙන් පිහිටා ඇත.

නැගෙනහිර සියනෑ කෝරළය, බටහිර සියනෑ කෝරළය, අළුත්කූරු කෝරළය, දකුණු අළුත්කූරු කෝරළය හා හාපිටිගම් කෝරළය යන කෝරළ පහෙන් ගම්පහ දිස්ත්‍රික්කය සමන්විත වේ. ගම්පහ යන ස්ථානීය නාමය මැදගම, ඉහළගම, පහළගම, හෙනරත්ගොඩ සහ අලුත්ගම එකතු කිරීමෙන් භාවිතයට පත් වූ බව ප්‍රකට වී ඇත. සංස්කෘතික, දේශපාලන හා අධ්‍යාපනික ක්ෂේත්‍රයන්හි ගම්පහ දිස්ත්‍රික්කයට අද්විතීය ස්ථානයක් හිමි වෙයි. දිවයිනේ අග නගරය හා ජාත්‍යන්තර වරායට මුවදොර පිහිටි ගම්පහ දිස්ත්‍රික්කය නිෂ්පාදන කර්මාන්ත කේන්ද්‍ර කරගත් නිදහස් වෙළඳ කලාප, සංචාරක ව්‍යාපාරය සම්බන්ධව ද ජාත්‍යන්තර ගුවන් තොටුපළ, දුම්රිය හා මහාමාර්ග මෙන්ම විදුලි බලය හා දුරකථන වැනි යටිතල පහසුකම් අතින් ද විශේෂ වැදගත්කමක් උසුලයි.

ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය වර්ග කිලෝමීටර 1,386.7 (හෙක්ටයාර 139,140) භූමි ප්‍රමාණයකින් යුක්ත වන අතර කොළඹ දිස්ත්‍රික්කය මෙන් දෙගුණයක විශාලත්වයක් දරයි. බස්නාහිර පළාතේ මුළු බිම් ප්‍රමාණයෙන් 38% හා ශ්‍රී ලංකා භූමි ප්‍රමාණයෙන් 2.1% ආවරණය වේ. උතුරු අක්ෂාංශ 6°54"5 සහ 7°20 අතර හා නැගෙනහිර දේශාංශ 79°48.75 සහ 80°13 අතර පිහිටා ඇත.
ගම්පහ දිස්ත්‍රික්කය 21.6°C අවම උෂ්ණත්වයකින් ද 37°C උපරිම උෂ්ණත්වයකින් ද මිලි මීටර් 1,750 පමණ වූ සාමාන්‍ය වර්ෂාපතනයකින් ද (හෙනරත්ගොඩ 2,477 මිලි මීටර්) යුතු උෂ්ණ තෙත් කලාපීය දේශගුණයක් විදහාපාන භූමි ප්‍රදේශයකි. වැසි ලැබෙන්නේ අන්තර් මෝසම් සුළඟ සහිත කාල පරිච්ඡේදයේ හා නිරිත දිග මෝසම් සුළං කාලයේ දී ය. ජනවාරි සිට අප්‍රියෙල් මාස අතර කාලය දිස්ත්‍රික්කය පුරා වියළි දේශගුණයක් පවතී.

ගම්පහ දිස්ත්‍රික්කයේ දක්නට ලැබෙන උෂ්ණ තෙත් දේශගුණික තත්වයන් මත තෙත් කලාපීය වෘක්ෂලතා ලක්ෂණ ඇති වන ප්‍රදේශ හා වගුරු බිම් ආශ්‍රිත කඩොලාන වනාන්තර දැකිය හැකි ය.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

රාජ්‍ය සේවාලාභී සත්කාරයේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ඵලදායී සම්පත් කළමනාකරණයක් තුළින් කාර්යක්ෂම පරිපාලන ව්‍යුහයක් බිහිකර ගම්පහ දිස්ත්‍රික්කය තිරසාර සංවර්ධනයක් කරා මෙහෙයවීම.

කාර්යභාරය

රාජ්‍ය ප්‍රතිපත්තීන්වලට අනුකූල වෙමින් මනා කළමනාකාරිත්වය තුළින් ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමේ ජනතාවගේ අපේක්ෂාවන් මල්පල ගන්වමින් ජනතාවාදී රාජ්‍ය සේවයක් ගොඩනැංවීම.

1.3 ප්‍රධාන කාර්යයන්

1. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ට අදාලව පරිපාලන කටයුතු මෙහෙය වීම හා මහජන පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම.

2. දිස්ත්‍රික් ලේකම් කාර්යාල කටයුතු මැනවින් පවත්වා ගැනීම, මානව සම්පත් කළමනාකරණය, භෞතික සම්පත් වැඩි දියුණු කිරීම, ගිනි අවි නිකුත් කිරීම, ගිනි අවි නිර්දේශ කිරීම හා ඩෙංගු වසංගත පාලනය කිරීම.

3. ආහාර නිෂ්පාදනය, මත් ද්‍රව්‍ය නිවාරණය, පරිසර ආරක්ෂණයට අදාලව කටයුතු කිරීම.

4. මිල පාලන, කුඩා ව්‍යාපාර සංවර්ධනය, ඵලදායිතා වැඩසටහන්, ආපදා කළමනාකරණයට සම්බන්ධ කටයුතු කිරීම.

5. සංස්කෘතික හා ආගමික උත්සව සංවිධානය හා සම්බන්ධීකරණය.

6. දිස්ත්‍රික් ලේකම් යටතේ අනුමත බලධාරිත්වය තුල කෙරෙන ව්‍යාපෘති කළමනාකරණය.

7. 256 වැය ශීර්ෂය යටතේ මුල්‍ය කළමනාකරණය හා විනය පවත්වා ගෙන යාම.

8. අනුමත ප්‍රතිපාදන සීමාව තුල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මෙහෙය වීම හා සහනාධාර ප්‍රගති පාලනය.

1.3 සංවිධාන සටහන



දිස්ත්‍රික් ලේකම් / දිසාපති
අතිරේක දිස්ත්‍රික් ලේකම්
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී
අංශ ප්‍රධානී
කළමනාකරණ සහකාර
කණිෂ්ඨ සේ.සේවය
සහකාර දි. ලේකම්
පරිපාලන නිලධාරී
ප්‍රධාන කළ.සහකාර
කළමනාකරණ සහකාර
කණිෂ්ඨ සේ.සේවය
අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
නියෝජ්‍ය අධ්‍යක්ෂ
සහකාර අධ්‍යක්ෂ
අංශ ප්‍රධානී
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සහකාර
කණිෂ්ඨ සේ.සේවය
ප්‍රාලේ - අත්තනගල්ල
ප්‍රාලේ - බියගම
ප්‍රාලේ - ජා ඇල
ප්‍රාලේ - දිවුලපිටිය
ප්‍රාලේ - දොම්පෙ
ප්‍රාලේ - ගම්පහ
ප්‍රාලේ - කටාන
ප්‍රාලේ - කැලණිය
ප්‍රාලේ - මහර
ප්‍රාලේ - මිනුවන්ගොඩ
ප්‍රාලේ - මීගමුව
ප්‍රාලේ - වත්තල
ප්‍රාලේ - මීරිගම
අභ්‍යන්තර විගණන අංශය
සමෘද්ධි අංශය
ඉංජිනේරු අංශය
ක්‍රීඩා අංශය
කුඩා ව්‍යාපාර අංශය
සංඛ්‍යා ලේඛන අංශය
යෞවන කටයුතු අංශය
සමාජ ආරක්ෂණ අංශය
මාධ්‍ය ඒකකය

1.4 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

1. ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
3. මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
4. මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
5. අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
6. කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
7. මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
8. දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
9. වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
10. ජා ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
11. කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
12. බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
13. මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය



2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි දැක්ම

දිස්ත්‍රික් සංවර්ධනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්ත්වයන් ඉහළ නැංවීම ජාතික ආර්ථික වර්ධනයේ පිළිබිඹුවක් වන බැවින් ඒ සඳහා ගම්පහ දිස්ත්‍රික්කයෙන් ඉහළ දායකත්වයක් ලබා දීම උදෙසා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ ආයතන කැපවීමෙන් කටයුතු කරනු ලබයි.

සිය සේවා අවශ්‍යතාවයන් ලබා ගැනීම සඳහා පැමිණෙන සේවා ලාභීන් සඳහා වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස අදාල සේවාවන් සැපයීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියළුම කාර්ය මණ්ඩල නිලධාරීන් ද ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු එම කාර්යාල වල සියළුම කාර්ය මණ්ඩල නිලධාරීන් ද නිරතුරුවම ලබා දෙන සේවය ඇගයිය යුතුය.

දිස්ත්‍රික් අනන්‍යතාවය රකිමින් ජාතික අවශ්‍යතාව සපුරාලන අතර ඊට අවැසි ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අප නිරතුරුවම බැඳී සිටිමු. රජයේ ප්‍රතිපත්ති වලට අනුකූල පරිපාලන ව්‍යුහයක් ඇති කිරීම තුළින් ගම්පහ දිස්ත්‍රික්කය තිරසාර සංවර්ධනයක් කරා රැගෙන යමින් පවතී.

ඒ අනුව 2019 වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වූ රට වෙනුවෙන් එකට සිටිමු ජාතික සංවර්ධන වැඩසටහනේ 6 වැන්න ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 13 කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික්කයක් වශයෙන් අප ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

ප්‍රවේශ මාර්ග, සමාජ සුභ සාධන, සුළු වාරි මාර්ග හා යටිතල පහසුකම් ආදී වූ සංරචක ගණනාවක් යටතේ ව්‍යාපෘති 5000 කට ආසන්න ප්‍රමාණයක් නිම කිරීමට ලැබීම 2019 වසරේ ලද තවත් ජයග්‍රහණයකි.

තවද දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සංවර්ධන කටයුතු වලට අදාලව 2019 වර්ෂයේදී ග්‍රාම ශක්ති වැඩසටහන මෙන්ම ග්‍රාම ශක්ති පළාත් මෙහෙයුම් කමිටුව ක්‍රියාත්මක කිරීමෙන් දැවැන්ත පියවරක් ඉදිරියට තැබීමට හැකි විය. එමෙන්ම කලක පටන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා පරිපාලන ගොඩනැගිල්ලක පැවති අඩුව සපුරමින් නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ආරම්භ කිරීම දිස්ත්‍රික් පරිපාලනයේ නවමු පියවරකට පා තැබීමකි.

සංවර්ධනය කරා යන ගමනේ අභියෝග රැසක් සමඟින් ඒවා ජයග්‍රහණය කරා රැගෙන යාමට අප නිරතුරුවම කටයුතු කරමින් සිටී. වැඩි ජන ඝනත්වයක් සහිත දිස්ත්‍රික්කයක් වන ගම්පහ දිස්ත්‍රික්කය නිරතුරුවම පරිසර හානිවීමට අදාල ක්‍රියාකාරකම් සිදුවන ප්‍රදේශයකි. ඒ අනුව වන ඝනත්වය සමතුලිතව පවත්වාගෙන යාම සඳහා රුක් රෝපණ වැඩසටහන් මෙන්ම වන ආරක්ෂණ වැඩසටහන් සිදු කළ යුතුව ඇත. වැඩිවන ජනගහනයත් සමඟ පරිසරයට එක්වන කසල නිසි ලෙස ප්‍රතිචක්‍රීයකරණය කිරීම සිදු කල යුතු වුව ද ඒ සඳහා සුදුසු වැඩ

පිළිවෙලක අවශ්‍යතාව තව දුරටත් අප හමුවේ ඇති අභියෝගයකි. එමෙන්ම නාගරික ජනගහනය වැඩි වීමත් සමඟ ඉඩකඩ හා නිවාස ප්‍රශ්ණය ද දැඩි ලෙස ජනතාව පීඩනයට පත් කරවන ගැටළුවක් ව ඇත.

ඉඩකඩ සීමිත වීම හා ජනගහනයේ වැඩිවීම ත් සමඟ ඩෙංගු වසංගත තත්ත්වය පැතිරීමේ අවධානමක් ද මතු වී ඇත. මෙවැනි වසංගත තත්ත්වයන් පාලනය සඳහා රජය විසින් විටින් විට ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් අනුව යමින් සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අනුබද්ධිතව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

තව ද, කැලණි හා අත්තනගලු ඔය වරෙක දිස්ත්‍රික්කය පෝෂණය කරන අතර තවත් විටෙක දැඩි ගංවතුර ආපදාවන්ට ලක් වී ජන ජීවිතය අඩාල කරන බැවින් ඒ සඳහා යටිතල පහසුකම් සංවර්ධනය හා මනා ලෙස ආපදා කළමනාකරණය සඳහා අවශ්‍ය පියවර ගනිමින් නිලධාරීන් මෙහෙයවීම නිරතුරුවම සිදු කරනු ලබයි.

කෙසේ වුව ද මේ සියළු අභියෝග ජයගනිමින් ඵලදායී සම්පත් කළමනාකරණයක් තුළින් කාර්යක්ෂම පරිපාලන ව්‍යුහයක් බිහි කිරීම කරා මෙහෙයවීම, 2030 වන විට සියළු දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් ලබා දීම, හා ඉහළ විශ්වාසදායී තිරසර ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් ඇති කිරීම තුළින් ගම්පහ දිස්ත්‍රික්කය සංවර්ධනයේ හිනි පෙත්තටම රැගෙන යාම දිස්ත්‍රික් ලේකම් වශයෙන් මාගේ ඉදිරි දැක්ම යි.

මෙම සියළු ජයග්‍රහණ, අභියෝග සාක්ෂාත් කර ගනු වස් සියළුම නිලධාරින් දුන් සහාය අගය කල යුතු අතර කාර්ය කටයුතු සම්බන්ධීකරණයේ දී ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, මුදල් අමාත්‍යාංශය හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ඇතුළු එම අමාත්‍යාංශවල රාජකාරි කරන ලේකම්වරු සහ අදාළ නිලධාරින් ලබා දුන් සහාය ද ප්‍රසංශනීය වේ.

සුනිල් ජයලත්
දිස්ත්‍රික් ලේකම් /දිසාපති
ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය

3. වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ - ඒසීඒ -

අයවැය (වර්තමාන වර්ෂය)		සටහන	කත්‍ය වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ - 1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		6,776,120,000	5,685,653,651	ඒසීඒ - 3
-	තැන්පතු		691,015,503	1,284,884,788	ඒසීඒ - 4
-	අත්තිකාරම් ගිණුම්		95,467,862	74,814,988	ඒසීඒ 5
-	වෙනත් ලැබීම්		485,002,689	337,510,719	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**8,047,606,054**	**7,382,864,146**	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)**		**8,047,606,054**	**7,382,864,146**	
	අඩු කළා : වියදම				
-	**පුනරාවර්තන වියදම්**		-	-	ඒසීඒ - 2(11)
980,000,000-	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	976,598,988	895,577,478	

111,800,000-	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	106,744,453	96,286,588	ජසීජ - 2(11)
13,200,000-	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම්	7	12,471,766	12,671,680	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,105,000,000-	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		**1,095,815,207**	**1,004,535,746**	
	මූලධන වියදම්				
18,000,000-	මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම	10	15,711,324	21,581,307	ජසීජ - 2(11)
1,221,000,000-	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	839,025,493	66,024,600	
-	ප්‍රාග්ධන පැවරීම්	12			
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13			
5,000,000-	හැකියා වර්ධනය	14	263,481	414,374	
2,700,000-	වෙනත් මූලධන වියදම්	15	2,098,085	10,776,200	
1,246,700,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**857,098,383**	**98,796,481**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**820,083,501**	**1,472,923,002**	ජසීජ -4
	තැන්පතු ගෙවීම්		702,618,739	1,370,002,959	ජසීජ - 5/5(අ)
	අත්තිකාරම් ගෙවීම්		117,464,762	102,920,043	
	මුළු වියදම උ = (ඈ+ඉ+ඊ)		2,772,997,091	2,576,255,229	
-	2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඈ-උ)		**5,274,608,963**	**4,806,608,917**	

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		වර්තමාන වර්ෂය රු	ඉකුත් වර්ෂය රු.
<u>**මූල්‍ය නොවන වත්කම්**</u>			
දේපල පිරියත හා උපකරණ	ඒසීඒ -6	3,139,698,047	2,189,928,873
<u>**මූල්‍ය වත්කම්**</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ 5/5(ඒ)	888,119,271	299,974,699
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ -3	4,695,117	-
මුළු වත්කම්		**4,032,512,435**	**2,489,903,572**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		(425,540,803)	(459,140,939)
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		3,139,698,047	2,189,928,873
කුලී වැඩ හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ -5(ආ)	566,147,672	
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ -4	747,512,402	759,115,638
අග්‍රිම ශේෂය	ඒසීඒ -3	4,695,117	-
මුළු වගකීම්		**4,032,512,435**	**2,489,903,572**

පිටු අංක 01 සිට 49 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 50 සිට 62 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	දිනය : 2/24
දිනය : 2020/02/26	දිනය : 20/2/24.	
එස්. හෙට්ටිආරච්චි ලේකම් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය "නිල මැදුර" ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.	...ල් ජයලත් ... ලේකම් / දිසාපති ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය	වී.ඩී.එස්. රොඩ්රිගෝ ප්‍රධාන ගණකාධිකාරි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගම්පහ.

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	වර්තමාන වර්ෂය රු.	ඉකුත් වර්ෂය රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයහන්</u>		
මුළු බදු මුදල්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	390,067,814	-
අග්‍රිම ලැබීම්	6,776,120,000	6,023,164,370
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**7,166,187,814**	**6,023,164,370**
අඩු කළා – මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	956,993,458	878,433,032
සහනාධාර හා මාරු කිරීම් වියදම්	-	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම්	5,087,525,575	4,688,111,874
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**6,044,519,033**	**5,566,544,906**

මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ) – (ආ)	**1,121,668,781**	**456,619,464**
<u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		-
පොලී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපකරණ අය කර ගැනීම	-	-
අත්තිකාරම් අය කර ගැනීම	2,128,650	431,890
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**2,128,650**	**431,890**
<u>**අඩු කළා - මුදල් වැය කිරීම්:**</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	808,590,472	61,263,462
අත්තිකාරම් ගෙවීම්	102,594,083	102,920,043
අයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**911,184,555**	**164,183,505**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඈ) – (ඉ)	**(909,055,905)**	**(163,751,615)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ) = (ඇ) – (ඊ)	**212,612,876**	**292,867,849**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	489,438,977	898,855,767
<u>මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)</u>	**489,438,977**	**898,855,767**
<u>*අඩු කළා - මුදල් වැය කිරීම්:*</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	702,051,853	1,191,723,616
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**702,051,853**	**1,191,723,616**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**(212,612,876)**	**(292,867,849)**
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) – (ඒ)	0	0
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	0	0
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	0	0

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වැය විෂයය	ප්‍රතිපාදනය					වියදම			ශුද්ධ බලපෑම		
	මූල්‍යකරණය (සංකේත අංකය)	වාර්ෂික අයවැය වෙන්කිරීම (1)	පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම (2)	මු.රෙ. 66/69 මාරු කිරීම (3) (-)/+	මුළු ශුද්ධ වෙන්කිරීම (4)=(1)+(2)+(3)	මුදල් පොතට අනුව වියදම (5)	මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6)	මුළු වියදම (7)=(5)+(6)	ඉතිරිය / (ඉක්මවීම) (8)=(4)-(7)	ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100	වෙනස්කම්වලට හේතු
<u>පුනරාවර්තන වියදම්</u>		**83,900,000**	**-**	**4,900,000**	**88,800,000**	**87,769,821**	**-**	**87,769,821**	**1,030,179**	**1.16**	
<u>වැඩසටහන (1)</u> වැඩසට./ව්‍යාපෘ./උප ව්‍යාපෘ./වැය විෂයය අංකය **256-1-1-0** **සටහන - 5 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ** <u>පුද්ගල පඩිනඩි</u>											
1001 වැටුප් හා වේතන		29,000,000	-	5,000,000	34,000,000	33,975,878	-	33,975,878	24,122	0.07	ඉතිරිය 5% වඩා අඩුයි.
1002 අතිකාල හා නිවාඩු දින වැටුප්		3,000,000	-	-	3,000,000	2,872,144	-	2,872,144	127,856	4.26	ඉතිරිය 5% වඩා අඩුයි.
1003 වෙනත් දීමනා		13,300,000	-	-	13,300,000	12,843,615	-	12,843,615	456,385	3.43	ඉතිරිය 5% වඩා අඩුයි.
										1.21	

		45,300,000	-	**5,000,000**	**50,300,000**	**49,691,637**	-	**49,691,637**	**608,363**		
සටහන - 6 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් භාණ්ඩ හා සේවා					-				-		
<u>ගමන් වියදම්</u>											
1101 දේශීය		1,350,000	-	-	1,350,000	1,289,807	-	1,289,807	60,193	4.46	ඉතිරිය 5% වඩා අඩුයි.
එකතුව (අ)		**1,350,000**	-	**-**	**1,350,000**	**1,289,807**	-	**1,289,807**	**60,193**	**4.46**	
<u>සැපයීම්</u>											
1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා		1,900,000	-		1,900,000	1,900,000	-	1,900,000	-	0.00	ඉතිරියක් නොමැත.
1202 ඉන්ධන		1,400,000	-	-	1,400,000	1,336,371	-	1,336,371	63,629	4.54	ඉතිරිය 5% වඩා අඩුයි.
1205 වෙනත්		600,000	-		600,000	592,745	-	592,745	7,255	1.21	ඉතිරිය 5% වඩා අඩුයි.
එකතුව (ආ)		**3,900,000**	-	**-**	**3,900,000**	**3,829,117**	-	**3,829,117**	**70,883**	**1.82**	
<u>නඩත්තු වියදම්</u>					-				-		
1301 වාහන		2,500,000	-	-	2,500,000	2,500,000	-	2,500,000	-	0.00	ඉතිරියක් නොමැත.
1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ		500,000	-	-	500,000	500,000	-	500,000	-	0.00	ඉතිරියක් නොමැත.
1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම්		900,000	-	-	900,000	876,740	-	876,740	23,260	2.58	ඉතිරිය 5% වඩා අඩුයි.
එකතුව (ඇ)		**3,900,000**	-	-	**3,900,000**	**3,876,740**	-	**3,876,740**	**23,260**	**0.60**	
<u>සේවා</u>					-				-		
1402 තැපැල් හා සන්නිවේදන		1,250,000	-	-	1,250,000	1,250,000	-	1,250,000	-	0.00	ඉතිරියක් නොමැත.
1403 විදුලිය හා ජලය		2,300,000	-	-	2,300,000	2,300,000	-	2,300,000	-	0.00	ඉතිරියක් නොමැත.
1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු		300,000	-	(200,000)	100,000	100,000	-	100,000	-	0.00	ඉතිරියක් නොමැත.

1409 වෙනත්		25,000,000	-		25,000,000	24,732,521	-	24,732,521	267,479	1.07	ඉතිරිය 5% වඩා අඩුයි.
එකතුව (ඇ)		**28,850,000**	-	**(200,000)**	**28,650,000**	**28,382,521**	-	**28,382,521**	**267,479**	**0.93**	
අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා මුළු වියදම (අ+ආ+ඇ+ඈ)		**38,000,000**	**-**	**(200,000)**	**37,800,000**	**37,378,184**	**-**	**37,378,184**	**421,816**	**1.12**	
									-		
සටහන - 7 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද මාරුකිරීම්, ප්‍රදානයන් සහ සහනාධාර											
<u>මාරුකිරීම්</u>											
1501 සුභසාධන වැඩසටහන්		-	-	-	-	-	-	-	-	-	-
1502 විශ්‍රාමික ප්‍රතිලාභ		-	-	-	-	-	-	-	-	-	-
1503 රාජ්‍ය ආයතන		-	-	-	-	-	-	-	-	-	-
1504 සංවර්ධන සහනාධාර		-	-	-	-	-	-	-	-	-	-
1505 සම්මාදම් සහ දායක මුදල්		-	-	-	-	-	-	-	-	-	-
1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොළී		600,000		100,000	700,000	700,000		700,000	-	0.00	ඉතිරියක් නොමැත.
1507 පළාත් සභා සඳහා දායකත්වය		-	-	-	-	-	-	-	-	-	-
1508 වෙනත්		-	-	-	-	-	-	-	-	-	-
1509 හදිසි අවශ්‍යතා අරමුදලට දායකත්වය		-	-	-	-	-	-	-	-	-	-
එකතුව		**600,000**	**-**	**100,000**	**700,000**	**700,000**	**-**	**700,000**	**-**	**-**	
සටහන - 8 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද පොළී ගෙවීම්					-				-		

1601 දේශීය ණය		-	-	-	-	-	-	-	-	-	-
1602 විදේශීය ණය		-	-	-	-	-	-	-	-	-	-
1603 භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර අවම්ල		-	-	-	-	-	-	-	-	-	-
එකතුව		-	-	-	-	-	-	-	-	-	-
සටහන - 9 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම්		-	-	-	-	-	-	-	-	-	-
1701 පාඩු සහ කපාහැරීම්		-	-	-	-	-	-	-	-	-	-
1702 අනපේක්ෂිත සේවා		-	-	-	-	-	-	-	-	-	-
1703 කාර්යාලීය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම		-	-	-	-	-	-	-	-	-	-
එකතුව		-	-	-	-	-	-	-	-	-	-
<u>වැඩසටහන (1)</u>		-	-	-	-	-	-	-	-	-	-
මුළු පුනරාවර්තන වියදම්වල එකතුව (සටහන 5-9)		**83,900,000**	**-**	**4,900,000**	**88,800,000**	**87,769,821**	**-**	**87,769,821**	**1,030,179**	**1.16**	ඉතිරිය 5% වඩා අඩුයි.
<u>මූලධන වියදම්</u>									-		
<u>වැඩසටහන (1)</u>									-		
වැය විෂය අනුව රාජ්‍ය ආයෝජන වියදම් වර්ගීකරණය									-		
සටහන - 10 මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම									-		
2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම්		10,000,000	-	-	10,000,000	9,909,109	-	9,909,109	90,891	0.91	ඉතිරිය 5% වඩා අඩුයි.

2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ		3,500,000	-		3,500,000	3,480,871	-	3,480,871	19,129	0.55	ඉතිරිය 5% වඩා අඩුයි.
2003 වාහන		4,500,000	-		4,500,000	2,321,345	-	2,321,345	2,178,655	48.41	අයවැය චක්‍රලේඛ 05/2019 අනුව සමස්ථ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 25%ක් ඉතිරි කිරිම හා වාහන නඩත්තු වියදම් අඩුවීම
එකතුව (අ)		**18,000,000**	-	**-**	**18,000,000**	**15,711,325**	-	**15,711,325**	**2,288,675**	**12.71**	
සටහන - 11 මූලධන වත්කම් අත්පත් කර ගැනීම					-				-		
2101 වාහන									-		
2102 ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ		12,500,000	-	-	12,500,000	1,471,344	-	1,471,344	11,028,656	88.23	අක්මුදල් හිඟ වීම හා අයවැය චක්‍රලේඛ 05/2019 අනුව සමස්ථ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 25%ක් ඉතිරි කිරිම
2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ		8,500,000	-	-	8,500,000	1,885,768	-	1,885,768	6,614,232	77.81	
2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම් - ප්‍රා.ලේ		200,000,000	-	-	200,000,000	472,781	-	472,781	199,527,219	99.76	වත්තල හා ජා-ඇල නව ගොඩනැගිලි ඉදිකිරීම ප්‍රමාද වීම හා අයවැය චක්‍රලේඛ 05/2019 අනුව සමස්ථ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 25%ක් ඉතිරි කිරිම

2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම් - දි.ලේ		1,000,000,000	-		1,000,000,000	835,195,600	-	835,195,60 0	164,804,400	16.48	අක්මුදල් හිඟ වීම හා අයවැය චක්‍රලේඛ 05/2019 අනුව සමස්ථ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 25%ක් ඉතිරි කිරීම
එකතුව (ආ)		**1,221,000,000**	-	**-**	**1,221,000,000**	**839,025,493**	-	**839,025,49 3**	**381,974,507**	**31.28**	
සටහන -12 ප්‍රාග්ධන මාරුකිරීම්									-		
එකතුව (ඇ)		-	-	-	-	-	-	-	-		
සටහන - 13 මූලය වත්කම් අත්පත් කර ගැනීම									-		
එකතුව (ඇ)		-	-	-	-	-	-	-	-		
සටහන - 14 හැකියා වර්ධනය					-				-		
2401 කාර්ය මණ්ඩල පුහුණු		3,000,000	-		3,000,000	245,981	-	245,981	2,754,019	91.80	අයවැය චක්‍රලේඛ 05/2019 අනුව සමස්ථ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 25%ක් ඉතිරි කිරීම
එකතුව (ඉ)		**3,000,000**	-		**3,000,000**	**245,981**	-	**245,981**	**2,754,019**	**91.80**	
සටහන - 15 වෙනත් මූලධන වියදම්					-				-		
2509 වෙනත්			2,700,000		2,700,000	2,098,085	-	2,098,085	601,915	22.29	අයවැය චක්‍රලේඛ 05/2019 අනුව සමස්ථ ප්‍රාග්ධන

											ප්‍රතිපාදනයෙන් 25%ක් ඉතිරි කිරීම
එකතුව (ඊ) වැඩසටහන (1)		-	**2,700,000**	**-**	**2,700,000**	**2,098,085**	-	**2,098,085**	**601,915** -	**22.29**	
රාජ්‍ය ආයෝජනයන්හි මුළු වියදම (අ+ආ+ඇ+ඈ+ඉ+ඊ)		**1,242,000,000**	**2,700,000**	**-**	**1,244,700,000**	**857,080,883**		**857,080,88 3**	**387,619,117**	**31.14**	අයවැය චක්‍රලේඛ 05/2019 අනුව සමස්ථ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 25%ක් ඉතිරි කිරීම
මුළු වියදම්වල එකතුව (සටහන 5-15)		**1,325,900,000**	**2,700,000**	**4,900,000**	**1,333,500,000**	**944,850,704**		**944,850,70 4**	**388,649,296**	**29.15**	
පුනරාවර්තන වියදම් වැඩසටහන (1) වැඩසට./ව්‍යාපෘ./උප ව්‍යාපෘ./වැය විෂයය අංකය **256-1-2-0** **සටහන - 5 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ** **පුද්ගල පඩිනඩි**		**1,021,100,000**		**(4,900,000)**	**1,016,200,000**	**1,008,045,386**	**-**	**1,008,045, 386**	**8,154,614**	**0.80**	
1001 වැටුප් හා වේතන		665,000,000	-	14,000,000	679,000,000	678,966,138	-	678,966,13 8	33,862	0.00	ඉතිරියක් නොමැත.

1002 අතිකාල හා නිවාඩු දින වැටුප්		15,000,000	-	2,000,000	17,000,000	14,706,253	-	14,706,253	2,293,747	13.49	ජනාධිපතිවරණය නිසා අතිකාල අඩුවෙන් ඉල්ලුම් කිරීම
1003 වෙනත් දීමනා		254,700,000	-	(21,000,000)	233,700,000	233,234,959	-	233,234,959	465,041	0.20	ඉතිරිය 5% වඩා අඩුයි.
		934,700,000	-	**(5,000,000)**	**929,700,000**	**926,907,351**	-	**926,907,351**	**2,792,649**	**0.30**	
සටහන - 6 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් භාණ්ඩ හා සේවා					-			-	-		
<u>ගමන් වියදම්</u>											
1101 දේශීය		28,000,000	-	-	28,000,000	24,140,478	-	24,140,478	3,859,522	13.78	ජනාධිපතිවරණය නිසා ගමන් වියදම් අඩුවෙන් ඉල්ලුම් කිරීම
එකතුව (අ)		**28,000,000**	-	**-**	**28,000,000**	**24140478**	-	**24,140,478**	**3,859,522**	**13.78**	
<u>සැපයීම්</u>											
1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා		12,000,000	-	2,000,000	14,000,000	13,972,691	-	13,972,691	27,309	0.20	ඉතිරිය 5% වඩා අඩුයි.
1202 ඉන්ධන		4,000,000	-		4,000,000	3,990,678	-	3,990,678	9,323	0.23	ඉතිරිය 5% වඩා අඩුයි.
1205 වෙනත්		200,000	-		200,000	199,865	-	199,865	135	0.07	ඉතිරිය 5% වඩා අඩුයි.
එකතුව (ආ)		**16,200,000**	-	**2,000,000**	**18,200,000**	**18,163,234**	**-**	**18,163,234**	**36,766**	**0.20**	
<u>නඩත්තු වියදම්</u>											
1301 වාහන		5,000,000	-		5,000,000	4,827,521	-	4,827,521	172,479	3.45	ඉතිරිය 5% වඩා අඩුයි.
1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ		1,200,000	-		1,200,000	1,185,973	-	1,185,973	14,027	1.17	ඉතිරිය 5% වඩා අඩුයි.
1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම්		1,600,000	-		1,600,000	1,572,314	-	1,572,314	27,686	1.73	ඉතිරිය 5% වඩා අඩුයි.

එකතුව (ඇ)		**7,800,000**	-	**-**	**7,800,000**	**7,585,807**	-	**7,585,807**	**214,193**	**2.75**	
<u>**සේවා**</u>											
1401 ප්‍රවාහන					-			-	-		
1402 තැපැල් හා සන්නිවේදන		3,800,000	-	400,000	4,200,000	4,173,230	-	4,173,230	26,770	0.64	ඉතිරිය 5% වඩා අඩුයි.
1403 විදුලිය හා ජලය		9,100,000	-	721,808	9,821,808	9,470,851	-	9,470,851	350,957	3.57	ඉතිරිය 5% වඩා අඩුයි.
1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු		1,000,000	-	(521,808)	478,192	478,192	-	478,192	-	0.00	ඉතිරියක් නොමැත.
1409 වෙනත්		8,000,000	-	(2,500,000)	5,500,000	5,354,477	-	5,354,477	145,523	2.65	ඉතිරිය 5% වඩා අඩුයි.
එකතුව (ඇ)		**21,900,000**	-	**(1,900,000)**	**20,000,000**	**19,476,749**	-	**19,476,749**	**523,251**	**2.62**	
අනෙකුත් භාණ්ඩ හා සේවා සඳහා මුළු වියදම (අ+ආ+ඇ+ඈ)		**73,900,000**	-	**100,000.00**	**74,000,000**	**69,366,269**		**69,366,269**	**4,633,731**	**6.26**	
සටහන - 7 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද මාරුකිරීම්, ප්‍රදානයන් සහ සහනාධාර					-			-	-		
<u>**මාරුකිරීම්**</u>					-			-	-		
1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොළී		12,500,000	-	-	12,500,000	11,771,766	-	11,771,766	728,234	5.83	රජයේ සේවකයන්ගේ දේපළ ණය ඉල්ලුම් කිරීම් අඩුවීම
එකතුව		**12,500,000**	**-**	**-**	**12,500,000**	**11,771,766**	**-**	**11,771,766**	**728,234**	**5.83**	
සටහන - 8 - වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද පොළී ගෙවීම්		-	-	-	-	-	-	-	-		
සටහන - 9 - වැය විෂය අනුව වර්ගීකරණය		-	-	-	-	-	-	-	-		

කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම්											
<u>වැඩසටහන (1)</u>					-			-	-		
මුළු පුනරාවර්තන වියදම්වල එකතුව (සටහන 5-9)		**1,021,100,000**	**-**	**(4,900,000)**	**1,016,200,000**	**1,008,045,386**	**-**	**1,008,045, 386**	**8,154,614**	**0.80**	
<u>මූලධන වියදම්</u>											
<u>වැඩසටහන (1)</u>											
වැය විෂය අනුව රාජ්‍ය ආයෝජන වියදම් වර්ගීකරණය											
සටහන - 10 මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම								-	-		
සටහන - 11 මූලධන වත්කම් අත්පත් කර ගැනීම			-	-	-	**-**	-	-	-		
සටහන -12 ප්‍රාග්ධන මාරුකිරීම්			-	-	-	**-**	-	-	-		
සටහන - 13 මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම			-	-	-	**-**	-	-	-		
සටහන - 14 හැකියා වර්ධනය								-	-		
2401 කාර්ය මණ්ඩල පුහුණු		2,000,000		-	2,000,000	17,500		17,500	1,982,500	99.13	අයවැය චක්‍රලේඛ 05/2019 අනුව සමස්ථ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් 25%ක් ඉතිරි කිරීම
එකතුව (ඉ)		**2,000,000**		**-**	**2,000,000**	**17,500**		**17,500**	1,982,500	**99.13**	
සටහන - 15 වෙනත් මූලධන වියදම්					-			-	-		

එකතුව (ඊ) වැඩසටහන (1)		-	**-**	**-**	- -	**-**		- -	- -		
රාජ්‍ය ආයෝජනයන්හි මුළු වියදම (අ+ආ+ඇ+ඈ+ඉ+ඊ)		**2,000,000**	**-**	**-**	**2,000,000**	**17,500**		**17,500**	**1,982,500**	**99.13**	
මුළු වියදම්වල එකතුව (සටහන 5-15)		**1,023,100,000**	**-**	**(4,900,000)**	**1,018,200,000**	**1,008,062,886**		**1,008,062,886**	**10,137,114**	**1.00**	



....

ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී

දිනය - 2020.06.12

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.000 වලින්

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
1003-07-02	රෙජිස්ටාර් ජනරාල්ගේ ලියාපදිංචි කිරීමේ ගාස්තු	-	75,630	50,032.27	66%
1003-07-03	පෞද්ගලික දැව ප්‍රවාහන ගාස්තු	-	-	775.21	-
1003-07-05	ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ගාස්තු	2,500	2,500	2,500.9	100%
1003-07-99	අනෙකුත් ගාස්තු	11,500	11,500	10,410.56	91%
2002-01-01	රජයේ ගොඩනැගිලි කුලී	1,100	900	1,056.28	117%
2002-02-99	වෙනත් ආදායම්	12,000	14,000	15,739.38	112%
2003-99-00	අනිකුත් ලැබීම්	8,000	6,000	5,912.24	99%
2003-02-99	විවිධ	7,000	7,000	8,082.57	115%
2003-02-03	හැඳුණුම්පත් ගාස්තු	-	-	33,687.65	-
2003-02-13	විභාග හා අනිකුත් ගාස්තු	-	-	960.1	-
2003-02-14	මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අය කිරීම්	-	-	232,275.67	-
1003-07-04	මෝටර් වාහන විකුණුම් මත බදු ආදායම	-	-	-	-
2003-04-00	රජයේ නිලධාරීන්ට යතුරුපැදි ලබා දීම	-	-	(45)	-
2004-01-00	වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අය කිරීම	-	-	70,853.93	-
1002-07-00	පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ගාස්තු සඳහා මුද්දර ගාස්තු	-	-	131	-
2006-02-01	ප්‍රාග්ධන වත්කම් ආදායම්(වාහන)	10	10	-	-
2006-02-02	ප්‍රාග්ධන වත්කම් ආදායම්(අනෙකුත්)	10	800	332.93	42%
1003-07-09	කාබන් බද්ද	-	-	19,698.73	-
2003-07-00	රජයේ වී මිල දී ගැනීමේ වැඩසටහන	-	-	1,799.65	-
	එකතුව			**454,204.07**	-

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,105,000	1,105,000	1,095,815.21	99%
ප්‍රාග්ධන	1,244,000	1,246,700	857,098.38	69%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තථ්‍ය වියදම	උපයෝගී කරගත් ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
001	ජනාධිපති කාර්යාලය	වැඩසටහන් සහ ව්‍යාපෘති වියදම්	141,138.85	141,138.85	81,103.66	57%
051	ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය	වැඩසටහන් සහ ව්‍යාපෘති වියදම්	1,196	1,196	832.74	70%
052	උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	5,137.92	5,137.92	3,902.25	76%
055	ජනමාධ්‍ය අමාත්‍යාංශය	වැඩසටහන් වියදම්	39	39	39	100%
101	බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	25,711.92	25,711.92	15,863.74	62%
103	ආරක්ෂක අමාත්‍යාංශය	වැඩසටහන් වියදම්	30	30	20.54	68%
104**	ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන,උතුරු පළාත් සංවර්ධන, වෘත්තිය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	4,936,891.35	4,936,891.35	2,397,244.99	49%
110	අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	10,730.11	10,730.11	10,253.77	96%
111	සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	1,328.7	1,328.7	1,276,.03	96%
117	මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය	වැඩසටහන් වියදම්	100	100	100	100%
118	මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	20,164.35	20,164.35	19,810.45	98%

120	කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	503,804.49	503,804.49	497,667.21	99%
122	ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	74,302.97	74,302.97	53,915.78	73%
124	කම්කරු, වෘත්තිය සමිති සබඳතා සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	653,563.66	653,563.66	649,275.93	99%
126 **	අධ්‍යාපන අමාත්‍යාංශ	ප්‍රාග්ධන වියදම්	57,079.77	57,079.77	22,223.86	39%
130	රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	44,834.53	44,834.53	34,421.18	77%
155	අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	542,313.59	542,313.59	530,652	98%
157**	ජාතික ඒකාබද්ධ, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	34,613.34	34,613.34	15,320.5	44%
160	මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	ප්‍රාග්ධන වියදම්	2,518.98	2,518.98	2,518.68	100%
162 **	මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය	ප්‍රාග්ධන වියදම්	236,149.88	236,149.88	51,271.55	22%
166**	නගර සැලසුම් ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	ප්‍රාග්ධන වියදම්	45,711.27	45,711.27	1,830	4%
193	කම්කරු, වෘත්තිය සමිති සබඳතා සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	272,457.5	272,457.5	272,457.5	100%
194**	විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	47,405.75	47,405.75	26,010.17	55%
195	සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යාන්තර වෙළඳ අමාත්‍යාංශය	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	287.98	287.98	286.67	100%
201	බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	48,201.47	48,201.47	47,466.54	98%
203	ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව	වැඩසටහන් වියදම්	15.6	15.6	15.6	100%
206	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	5,135.2	5,135.2	4,768.18	93%
210	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	183.33	183.33	183.33	100%

216	සමාජ සේවා දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	18,860.03	18,860.03	17,966.48	95%
217	පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	15,396.98	15,396.98	15,396.98	100%
219	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	වැඩසටහන් හා ප්‍රාග්ධන වියදම්	2,150.01	2,150.01	1,986.67	92%
220	ආයුර්වේද දෙපාර්තමේන්තුව	වැඩසටහන් වියදම්	34.5	34.5	3	9%
227	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	11,645.09	11,645.09	11,516.39	99%
248	ශ්‍රී ලංකා සුරා බදු දෙපාර්තමේන්තුව	ප්‍රාග්ධන වියදම්	30,640	30,640	18,397.99	60%
252	ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	2,888.98	2,888.98	2,839.81	98%
253	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	385,583.14	385,583.14	379,419.15	98%
254	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	7,395.98	6,700.72	5,248.76	78%
286	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	111.53	111.53	105.67	95%
289	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	වැඩසටහන් වියදම්	800	800	799.87	100%
307	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන වියදම්	4,535.27	4,535.27	4,025.55	89%
308	තැපැල් දෙපාර්තමේන්තුව	ප්‍රාග්ධන වියදම්	1,851.3	1,851.3	1,804.89	97%
326	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	ප්‍රාග්ධන වියදම්	966.5	966.5	32.5	3%
327	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	970.5	970.5	942	97%
328	මිනිස් බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව	පුනරාවර්ථන හා ප්‍රාග්ධන වියදම්	1,414.26	1,414.26	1,355.57	96%

5,202,573.11

සටහන : ** අවශ්‍ය පරිදි අක්මුදල් ලබා නොදීම නිසා මූල්‍ය ප්‍රගතිය අඩුවී ඇත.

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	838,536.29	838,536.29	-	100%
9152	යන්ත්‍රෝපකරණ	397,429.08	397,429.08	-	100%
9153	ඉඩම්	954,802	954,802	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	100%
9160	කෙරීගෙන යන වැඩ	948,930.67	948,930.67	-	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	100%

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } WNP1/GP/A/DS/FA/2019/22 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020 මැයි 31 දින

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 9 (11) වගන්තිය ප්‍රකාරව යථෝක්ත වාර්තාව සහ භාෂාත්‍රයෙන් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන මේ සමග ඉදිරිපත් කරමි.

ඩූ. මුණසිංහ
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ඩූ. මුණසිංහ
සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත - දිස්ත්‍රික් ලේකම්, ගම්පහ

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. WNP1/GP/A/DS/FA/2019/22 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2020 මැයි 31 දින

රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්,

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය

සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍යව ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට .

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 පුනරාවර්තන හා මූලධන වියදම්

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වැය ශීර්ෂ 05 ක් වෙනුවෙන් කරන ලද වියදමට අදාළව ඒකාබද්ධ ගිණුම් සාරාංශ අනුව දැක්වෙන වටිනාකම සහ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු උපලේඛනය අනුව වියදම අතර රු.2,259,701 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.1.2 අත්තිකාරම් ගිණුම්

රජයේ නිළධාරීන්ට අත්තිකාරම්

මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ, සේවය හැර ගොස් ඇති සහ පලාත්සභා ආයතනවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.2,694,690 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඒ තුළ වර්ෂ 4 කට වැඩි කාලයක සිට අය විය යුතුව පවතින ශේෂයන්ගේ එකතුව රු.1,012,282 ක් විය.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 තැන්පතු ගිණුම

පොදු තැන්පත් ගිණුම් 3 ක අවස්ථා 280 කදී තැන්පත් කර වර්ෂ දෙකකට වඩා කල් ඉකුත් වූ නමුත් නිරවුල් නොකරන ලද වටිනාකම රු.15,285,438 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

1.6.2.2 අග්‍රිම ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 ජනවාරි 01 දින සිට අග්‍රිම ගිණුමේ පැවති රු.෧7425ක නොපියවූ උප අග්‍රිම ශේෂය 2019 දෙසැම්බර් 31 දිනටද නොපියවා එසේම පැවතුණි.

(ආ) 2019 දෙසැම්බර් 31 දිනට නොපියවන ලද මැතිවරණ අත්තිකාරම් ශේෂය රු.4,687,692ක් විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2019 වර්ෂයේ එක් එක් මාසයක් සඳහා වූ අග්‍රිම සැලසුමට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ඉල්ලුම් කළ යුතු අග්‍රිමය රු.14,721,985,000 ක් වූ අතර ඉල්ලුම් කරන ලද අග්‍රිමය රු.13,840,349,559 ක් විය. නමුත් එම ඉල්ලුම් කරන ලද අග්‍රිමයන් සමාලෝචිත වර්ෂය තුලදී රු.6,776,120,000 ක් එනම් ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් සියයට 49 ක් පමණක් ලැබී තිබුණි. මේ හේතුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යසාධනය සැලසුම් කළ පරිදි ඉටු කර ගැනීමට අපොහොසත් වී තිබූ බවද නිරීක්ෂණය විය.

2.2 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඌන ඇස්තමේන්තු පිළියෙල කර තිබීම

පුනරාවර්තන වැය විෂයන් 06 කට අදාළව මුදල් රෙගුලාසි 66 ප්‍රතිපාදන යටතේ වෙනත් වැය විෂයයන්ගෙන් රු.24,221,808 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණු අතර මාරු කරගත් ප්‍රතිපාදනය ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 01 සිට සියයට 14 දක්වා වූ පරාසයක පැවතුණි. මේ තුළ මූලික ප්‍රතිපාදනය රු.31,100,000 ක් වූ වැය විෂයයන්

දෙකක් සඳහා රු.2,100,000 ක් වූ ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණු නමුත් එසේ මාරු කරන ලද ප්‍රතිපාදනය වියදම් නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ආ) අධි ප්‍රතිපාදන සලසාගෙන තිබීම

පුනරාවර්තන වැය විෂයයන් 03 කට අදාලව රු.24,221,808 ක් අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට සියයට 56 දක්වා වූ පරාසයකින් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයන්ට ප්‍රතිපාදන මාරු කර තිබුණි.

(ඇ) ශුද්ධ ප්‍රතිපාදන හා වියදම අතර වෙනස

පුනරාවර්තන වැය විෂයන් දෙකක 2019 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 13 ක් සහ සියයට 14 ක් වූ ඉතිරිවීම් සඳහා හේතුව "ජනාධිපතිවරණය නිසා අතිකාල අඩුවෙන් ඉල්ලුම් කිරීම" වශයෙන් දක්වා තිබුණි. නමුත් ජනාධිපතිවරණය පැවැත්වීමට පෙර මාසය වූ 2019 ඔක්තෝම්බර් 31 දින වන විටද එම වැය විෂයයන් දෙකෙහි ඉතිරිවීම පිළිවෙලින් සියයට 31 ක් සහ සියයට 39 ක් ලෙස පැවති බැවින් ඉතිරිවීම් සඳහා දක්වන ලද හේතු පිළිගත නොහැකි තත්ත්වයක පැවතුණි.

(ඈ) 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛ උපදෙස් අනුව සමස්ථ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් සියයට 25 ක ඉතිරිවීම් කළ යුතු වුවත් එම සීමාව ඉක්මවා එනම් සියයට 31.09 ක ඉතිරිවීම් නිරීක්ෂණය වූ අතර එක් එක් මූලධන වැය විෂයයන් සැලකීමේදී වැය විෂයයන් 06 ක සියයට 25 ඉක්මවා එනම් සියයට 48 සිට සියයට 99 දක්වා වූ පරාසයන්ගෙන් ඉතිරිවීම් සිදු කර තිබුණි.

2.3 බලය නොලත් කාරක පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2014 ජුලි 15 දින සිදු වූ සේප්පුවේ මුදල් අතුරුදහන් වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(ආ) ප්‍රකාරව පවත්වන ලද පරීක්ෂණ මණ්ඩල

අවසන් වාර්තාව අනුව මෙම මුදල් අස්ථානගත වීම සම්බන්ධයෙන් කාර්යාලයීය සියළු නිලධාරීන් වගකීමට බැඳෙන බවත්, ඒ අතරින් සමස්ථ අධීක්ෂණ සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම්, ගණකාධිකාරී, මුදල් සහකාර සහ සරප් යන නිලධාරීන්ගේ රාජකාරි කටයුතුවල පැවති අඩුපාඩු, නොසැලකිලිමත් බව සහ අනවධානය හේතු වී ඇති බැවින් මෙමගින් රජයට සිදු වූ අලාභය එම නිලධාරීන් හතර දෙනාගෙන් අයකර ගත යුතු බවට යෝජනා ඉදිරිපත් කර තිබුණි. මේ අනුව රු.1,082,245 ක් වූ අලාභය මෙම නිලධාරීන් සිව් දෙනා අතර සමානව බෙදමින් එක් අයෙකුගෙන් රු.270,561 බැගින් අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම්වරයා විසින් නිර්දේශ කර, අනුමැතිය ලබාගැනීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යංශ ලේකම්වරයා වෙත 2018 අගෝස්තු 06 දින යවා තිබුණ නමුත් 2020 මැයි මාසය වන විටත් එම අනුමැතිය ලැබී නොතිබුණ බැවින් අලාභය අයකර ගැනීමට කටයුතු කිරීමට නොහැකිවී තිබුණි.

(ආ) ජා- ඇල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් අංක PC 5174 දරන රථය 2014 අප්‍රේල් 28 දින සිදුවූ අනතුරක් හේතුවෙන් රු.148,583 ක හානියක් සිදු වී තිබුණු අතර එයින් රක්ෂණයෙන් අයකර ගත නොහැකි හානිය රු.18,583 ක් විය. හානි හා පාඩු ලේඛනය අනුව මු.රෙ. 109 යටතේ 2019 ජනවාරි 14 දිස්ත්‍රික් ලේකම්වරයාගේ ලිපිය ප්‍රකාරව පොතෙන් කපා හැරීමට කටයුතු කර තිබුණද, මූල්‍ය ප්‍රකාශන අනුව මු.රෙ.109 පොතෙන් කපාහැරීමක් ලෙස ඇතුළත් කර නොතිබුණි.

(ඈ) කටාන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් අංක 252-3452 දරන කැබ් රථය 2006 ඔක්තෝම්බර් 28 දින ගංවතුර අධාර බෙදීමේදී අනතුරකට ලක්වීමෙන් සිදුවූ අලාභය රු.234,890 ක් ලෙස ගණනය කර තිබුණි. අනතුර සිදුවී වර්ෂ 4 කට පසු එනම් 2010 ජූනි 23 දින පරීක්ෂණ කමිටු තීරණය ලබාදී තිබූ අතර මුදල් රෙගුලාසි ප්‍රකාර ප්‍රාථමික වාර්තාව හා අවසන් වාර්තාව සකස් කර නොතිබුණි. වර්ෂ 10 කට පසුව එනම් 2016 අගෝස්තු 31 දින අනතුර සම්බන්ධව ක්‍රියාකර ඇති අතර සිදු වූ ප්‍රමාද තත්වයන් හේතුවෙන් මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව අනතුරට අදාල ලියවිලි ඉදිරිපත් කළ නොහැකි බව දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ස්වදේශ කටයුතු අමාත්‍යංශ ලේකම්වරයා වෙත දැනුම් දී තිබුණි. රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 2016/02 අනුව රු.250,000 ට වඩා අඩු අලාභ සම්බන්ධ තීරණ ගැනීමේ බලය දෙපාර්තමේන්තු ප්‍රධානියා සතු වන බැවින් මෙම අලාභය සම්බන්ධයෙන් කටයුතු කිරීමට දිස්ත්‍රික් ලේකම්වරයා වෙත බලය පවරමින් උපදෙස් ලැබී තිබුණද 2006 ඔක්තෝම්බර් 28 දින සිදුවූ අනතුරක් බැවින් එම කාලයේදී

මෙම වට්නාකමට අදාළව ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලය පැවරී තිබුණේ අමාත්‍යාංශයට බැවින් ඒ පිළිබඳ නැවත කමිටුවක් මඟින් අලාභය සම්බන්ධ කයුතු කිරීමට යෝජනා කර ස්වදේශ කටයුතු අමාත්‍යංශය වෙත 2017 අප්‍රේල් 25 දින දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ලිපියකින් දන්වා තිබුණි. කෙසේ වෙතත් මෙම දිනයෙන් පසු අමාත්‍යාංශය විසින් හෝ දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගැනීම නිසා මෙම අලාභය අදාල වගකිවයුතු නිළධාරීන්ගෙන් අයකර ගැනීමට හෝ පොත්වලින් කපා හැරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන තුරුම කටයුතු කර නොතිබුණි.

(ඇ) මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාල අංක 251- 3437 දරන කැබ් රථය 1999 ජූලි 09 දින වාහනයේ නිත්‍ය රියදුරු නිවාඩු ලබා සිටි අවස්ථාවක අත්‍යවශ්‍ය රාජකාරි කටයුත්තක් වෙනුවෙන් වාහනය පැදවූ අවස්ථාවකදී මෙම අනතුර සිදු වී තිබුණි. ඒ අනුව රක්ෂණයෙන් අයකර ගත නොහැකි අලාභය රු.189,360 ක්වූ අතර මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව අලාභයන් පිලිබඳව සිදු කරන ලද ප්‍රාරම්භක වාර්තාව අනුව අනතුර සිදු කල වැන් රථයේ රියදුරු මේ සඳහා වගකිව යුතු විය. ඒ අනුව අදාළ රියදුරුට විරුද්ධව නීතිපතිවරයා විසින් 2001 නොවැම්බර් 05 දින වාර්තා කර තිබූ අතර වරින් වර ආයතන අතර ලිපි හුවමාරුව ප්‍රමාද වෙමින් පැවතීම නිසා නඩු කටයුත්ත ප්‍රමාද වෙමින් පැවතුණි. ඒ අතරතුර විත්තිකරු විදේශගත වීමෙන් සිතාසි භාර දීමට නොහැකි වීම හේතුවෙන් නඩුව තවදුරත් ඉදිරියට පැවතෙමින් පැවති අතර අදාළ විත්තිකරුගේ ලිපිනය සොයා ගෙන නීතිපති වෙත තොරතුරු ඉදිරිපත් කර තිබුණද නඩුවෙහි ඉදිරි කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගෙන නොතිබුණි. ඒ අනුව මෙතෙක් එම අලාභය අයකර ගැනීමට නොහැකි වී තිබුණ අතර මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිළධාරීන් විසින් මේ සම්බන්ධයෙන් රාජකාරි ඉටුකිරීමේදී ගෙන ගිය මන්දගාමී ක්‍රියාකාරිත්වයද මෙම ප්‍රමාදයට හේතු වී තිබූ බව නිරීක්ෂණය විය.

2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

වියදම් ඇස්තමේන්තුවට අමතරව මුදල් රෙගුලාසි අංක 66 වීරමොං ක්‍රියාපටිපාටිය යටතේ අමතර ප්‍රතිපාදන එකතු කරගෙන තිබුණද මුදල් රෙගුලාසි අංක 94(1) ට පටහැනිව පුනරාවර්තන වැය විෂයයන් දෙකක් සඳහා රු.136,801 කින් ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැදී තිබුණි.

2.5 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

2019 වර්ෂයේදී විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 44 කින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික් ලේකම්වරයා වෙත වෙන් කර තිබු රු.8,192,596,320 ක් වූ ප්‍රතිපාදනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති ඉටු නොකිරීම නිසා ඉතිරි වූ ප්‍රතිපාදනය රු.2,990,023,207 ක් විය. ඒ අතරින් පහත දැක්වෙන අමාත්‍යාංශ 06 මඟින් විවිධ ව්‍යාපෘති ඉටු කරවා ගැනීම සඳහා ප්‍රතිපාදනය කර තිබූ රු.5,357,851,351 ක් සඳහා අවශ්‍ය පරිදි අක්මුදල් නොලැබීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවී තිබුණේ රු.2,513,901,055 ක් වටිනා ව්‍යාපෘති පමණක් වූ බැවින් පාර්ලිමේන්තුව විසින් සලසා දී තිබූ ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය	ලැබී තිබුණු ප්‍රතිපාදනය	තත්‍ය වියදම	ප්‍රතිපාදනය උපයෝජනය
		රු.	රු.	%
104	ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන/උතුරු පළාත් සංවර්ධන/වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය	4,936,891,349	2,397,244,988	49
126	අධ්‍යාපන අමාත්‍යාංශය	57,079,770	22,223,857	39
157	ජාතික ඒකාබද්ධ, රාජ්‍ය භාෂා/සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය	34,613,336	15,320,490	44
162	මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය	236,149,875	51,271,554	22
166	නගර සැලසුම් ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	45,711,269	1,830,000	4
194	විදුලි සංදේශ/විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය	47,405,752	26,010,166	55
		5,357,851,351	2,513,901,055	

03. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

යූ. මුණසිංහ
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත: ~~දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ.~~ Ud.

4. කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	**75%-89%**	**50%-74%**
පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම		87%	
අත්පත් කර ගැනීම්			16%
ඉදි කිරීම්			70%
වෙනත් ප්‍රාග්ධන වියදම්			31%
එකතුව			**69%**

සටහන - අයවැය චක්‍රලේඛ 05/2019 අනුව සමස්ථ ප්‍රතිපාදනයෙන් 25% ක් ඉතිරි කිරීම නිසා ප්‍රගතිය අඩු වී ඇත. ඒ අනුව නිවැරදි ප්‍රගතිය 69%+25%=94% ක් විය යුතුය.

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සියළු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	ජාතික මට්ටමේ අර්ථ නිරූපන වලට අනුකූල වන පරිදි සියළුම ආකාරයේ දරිද්‍රතාවන්ගෙන් පෙළෙන සියළුම වයස් කාණ්ඩයන්ට අයත් පිරිමින්, කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩු කිරීම	• ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස අනුව ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහල ජීවත්වන ජනගහනයේ අනුපාතය • ජාතික නිර්වචනයන් වලට අනුව දරිද්‍රතාවයේ සියලු මානයන්ට අදාල තත්ත්වය තුල ජීවත් වන සියළු වයස් කාණ්ඩයන්ට අයත් පුරුෂ, ස්ත්‍රී හා ළමා ජනගහනයේ ප්‍රමාණය			
	පහළ මට්ටමේ අය ද ඇතුලත්ව සියළුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම සහ 2030 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවධානම් කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස එමගින් ආවරණය කර තිබීම	සමාජ ආරක්ෂණ තල / ක්‍රම මගින් ආවරණය සැපයෙන ජනගහනයේ ප්‍රමාණය			
	2030 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන්නන්ගේ සහ අවධානමට ලක් විය හැකි තත්වයේ සිටින්නන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන් කාලගුණික තත්ත්වයන්ගෙන් ඇතිවන හානිකර බලපෑම් ද ආර්ථික සමාජ හා පරිසර වශයෙන් ඇතිවන හානි සහ ආපදා වලට නිරාවරණය වීම ද අඩු කිරීම	ජනගහනයේ ලක්ෂයකින් ස්වාභාවික හේතුවෙන් මියයන අතුරුදහන් වන සහ සෘජුව බලපෑමට ලක්වන පුද්ගලයින් සංඛ්‍යාව			

සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුලත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට ලක් වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරි, පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම	මන්දපෝෂණයේ ව්‍යාපෘතිය			
	අවුරුදු 5 ට අඩු ළමුන් සම්බන්ධයෙන් මිටි වීම සහ ක්ෂය වීම පිළිබඳ අන්ජාතික වශයෙන් එකඟතාවයට පත්වූ ඉලක්ක 2025 වන විට ළගා කර ගැනීමද ඇතුලත්ව 2030 වන විට සියළුම ආකාරයේ පවත්නා මන්දපෝෂණ තත්වයන් තුරන් කිරීම සහ නව යොවුන් ගැහැණු ළමුන්ගේ, ගැබිණි මාතාවන්ගේ කිරිදෙන මව්වරුන්ගේ සහ වයස්ගත පුද්ගලයින්ගේ පෝෂණ අවශ්‍යතාවයන්ට විසඳුම් ලබා දීම	වයස අවුරුදු 5 ට අඩු දරුවන් අතර කුරුභාවයේ ව්‍යාප්තිය (ලෝක සෞඛ්‍ය සංවිධානයේ ළමා වර්ධන ප්‍රමිතීන්ට අනුව, වයසට අදාල උසෙහි මධ්‍යනය අගයෙන් < - 2 සම්මත අපගමනයක්)			
නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුබ සාධනය ප්‍රවර්ධනය කිරීම	2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ ප්‍රතිකාර මගින් 1/3 කින් අඩුකර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම	• හෘද නාල ආශ්‍රිත රෝග, පිළිකා, දියවැඩියාව හෝ නිදන්ගත රෝග හේතුවෙන් මියයන ප්‍රමාණය • සියදිවි නසා ගැනීම් හේතුවෙන් ජීවිත අහිමි වන ප්‍රමාණය			
	හානිකර ආකාරයට මධ්‍යසාර භාවිතය සහ අන්තරාකාරි ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග හා ප්‍රතිකාර ශක්තිමත් කිරීම	වර්ෂයක් තුල වයස අවුරුදු 15 හෝ ඊට වැඩි පුද්ගලයන් අතර ඒක පුද්ගල මධ්‍යසාර පරිභෝජනය			
පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	2030 වන විට සියළුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමා විය සංවර්ධනය ලබා දීම තහවුරු කිරීම	ඉගෙනුම් සහ මනෝවිද්‍යාත්මක අංශයන්ගෙන් යහපත් සංවර්ධන මාර්ගයකට අවතීර්ණව සිටින වයස අවුරුදු 5 ට අඩු ළමුන්ගේ ප්‍රමාණය			
	අධ්‍යාපන පහසුකම් ගොඩනැංවීම	විදුලිය, පානීය ජලය ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සැලසීම			

සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම	2030 වන විට සියළු දෙනාට සමානාත්මතාවයෙන් යුතුව ආරක්ෂාකාරි සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම	සුරක්ෂිතව කළමනාකරණය කෙරෙන පානීය ජල සැපයුම් සේවා භාවිතා කරන ජනගහනයේ ප්‍රමාණය			
	2030 වන විට සියළු දෙනාට සමානාත්මතාවයෙන් යුතුව සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව ලබා ගැනීමට හැකි වීම	ආරක්ෂිතව පාලනය වන සනීපාරක්ෂක සේවා භාවිතා කරන ජනගහනයේ ප්‍රමාණය			
සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම තහවුරු කිරීම	2030 වන විට සියළුම දෙනාට අඩු මිලකට ලබා ගත හැකි විශ්වාසදායී නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රෙවිශ විය හැකි බවට තහවුරු කිරීම	විදුලිය සැපයුම සහිත ජනගහනයේ ප්‍රමාණය			
	2030 වන විට ලෝක බලශක්ති මූලාශ්‍රයන්හි පුනර්ජනනීය බලශක්තියන්හි කොටස ඉහළ නැංවීම	සමස්ත අවසන් බලශක්ති පරිභෝජනයෙන් පුනර්ජනනීය බලශක්ති පංගුව			
සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයන් ද ඇතුලත්ව සියළුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී සුදුසු රැකියා අවස්ථාවන් ලබා දීම	• විවිධ සාධක අනුව පැයක සාමාන්‍ය ආදායම් ඉපැයීම • විරැකියා අනුපාතය			
සවිමත් යටිතල පහසුකම් ගොඩනැංවීම, පරිපූර්ණ හා තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම	ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම	වසරපුරා භාවිතා කළ හැකි මාර්ගයක සිට කි.මී.2 ක දුර ප්‍රමාණයක් තුළ ජීවත් වන ග්‍රාමීය ජනගහනයේ ප්‍රමාණය			
	කුඩා පරිමාණ කර්මාන්ත සහ වෙනත් ව්‍යවසායන් සඳහා මූල්‍ය සේවාවන්, ණය ලබා ගැනීමේ ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීම සහ එම ව්‍යවසායන් වටිනාකම් දාමයන්ට සහ වෙළඳපොළ දාමයන්ට ඒකාබද්ධ කිරීම	සමස්ත නිෂ්පාදන අගය කිරීම් වල පංගුවක් ලෙස කුඩා පරිමාණ නිෂ්පාදන ප්‍රමාණය			
නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	2030 වන විට සියළු දෙනාට ප්‍රමාණවත් සහ ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් වැඩිදියුණු කිරීම	පැල්පත්, අවිධිමත් ජනාවාස හෝ ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් යටතේ ජීවත් වන ජනගහනය			
	ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කිරීම	ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් රැක ගැනීම හා ආරක්ෂා කිරීම වෙනුවෙන් කරන සමස්ත ඒක පුද්ගල වියදම			

තිරසර පරිභෝජනය හා නිෂ්පාදන රටාවක් තහවුරු කිරීම	2030 වන විට අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම, අඩු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය	ප්‍රතිචක්‍රීකරණ වේගය, ටොන් ගණන			
දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම	කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වාභාවික ආපදාවන්ට ඔරොත්තු දීමේ සහ එවැනි තත්ත්ව වලට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම	පුද්ගලයින් ලක්ෂයක් අතරින් හදිසි ආපදා හේතුවෙන් සිදුවන මරණ, අතුරුදහන් වන හා ඍජුව බලපෑම්වලට ලක්වන පුද්ගලයින් සංඛ්‍යාව			

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

රටක සංවර්ධනය වේගවත් වුව ද එය ඵලදායී ලෙස මානව ප්‍රජාව වෙතට ගෙන යාමට හැකි නම් එහි නියම ඵල ජනතාවට භුක්ති විඳිය හැකි ය. රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව විවිධ ඉලක්ක වෙත යාමේදී තිරසර සංවර්ධන අරමුණු වලට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. ඒ අනුව ආයතනයක කාර්යයන් මැනවින් කළමනාකරණය කොට ප්‍රතිලාභ ඍජු ලෙස සමාජ ගත කිරීමේ දී තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් එය යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතු ය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මහජන සේවාවන් සැපයීමේ දී තිරසර සංවර්ධන අරමුණු වෙත යාමේදී විටෙක අදාල ඉලක්ක පහසුවෙන් ලඟා කර ගත හැකි වුව ද තවත් විටෙක එම ඉලක්ක වලට අභියෝගාත්මක ලෙස බාධා පමුණුවයි. විශේෂයෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ වැඩි ජනගහනයක් වාසය කිරීමත් ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්තය හා කර්මාන්ත යන අංශ ඉදිරියෙන් සිටින බැවිනුත්, පරිසර ආරක්ෂාවට වැඩි බරක් තබමින් කටයුතු කිරීමට සිදුව ඇත.

විශේෂයෙන් දිස්ත්‍රික් ජනතාව දුගී බවින් මුදවාලීම, විවිධ පාරිසරික හා කාළගුණික හේතූන් මත සිදුවන විපත්තිදායක තත්ත්වයන්ගෙන් මුදවාලීම, පෝෂණ මට්ටම් ඉහළට ගෙන යමින් ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ වටිනාකම පෙන්වා දෙමින් කෘෂිකර්මාන්තය ඉහළ තලයකට ගෙන යාමත් විශේෂයෙන් කළ යුතු වේ.

මන්දපෝෂණ තත්ත්වයන් පාලනය කිරීම තුළින් සුපෝෂිත ළමා පරපුරක් ඇති කිරීම ත්, ළමා හා වයස්ගත පිරිස් වලට සුභසාධනය සැපයීමත් කල යුතු වේ. තව ද සංවර්ධන කාර්යයට ඍජුවම දායක වන අනෙකුත් ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමත්, මධ්‍යසාර භාවිතය වැනි තත්වයන්ගෙන් පිරිස් මුදවා ගැනීමත් තිරසාර සංවර්ධනයට හොඳ ප්‍රවේශයක් සපයනු නිසැක ය.

එබැවින් දිස්ත්‍රික්කය තුල අධ්‍යාපන මට්ටම ඉහළ දැමීම සඳහා අවශ්‍ය පහසුකම් අදාල ආයතන හා සම්බන්ධ වෙමින් ලබා දීමට ත් ඉගෙනුම් කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට ත් කටයුතු කර ඇත. එමෙන්ම විදුලිය, ජලය, සනීපාරක්ෂාව, ග්‍රාමීය යටිතල පහසුකම්, සුළු පරිමාණ කර්මාන්ත, අවිධිමත් ඉදිකිරීම්/නිවාස හා ඉඩම් ගැටළු විසඳීමට ද සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර ගැනීම, කසල කළමනාකරණය හා ආපදා තත්ත්වයන් පාලනය වැනි දැවෙන ප්‍රශ්ණ සඳහා විසඳුම් ලබා දීමට කටයුතු සිදු

කර ඇත. මහජන සුභසාධනය අරමුණු කර ගනිමින් ආයතනයක් ලෙස ඉටුකල හැකි උපරිම පරිශ්‍රමයන් හා දායකත්වයන් තුළින් අදාල සංවර්ධන ඉලක්ක වෙත යාමේ දී මහජනතාවගෙන් විවිධ අවස්ථාවල දී බාධා කිරීම් සිදු වුවද එම අභියෝග ජයගනිමින් සංවර්ධන ඉලක්ක වෙත යාමට උත්සහ කරමින් සිටී. ඒ අනුව දිස්ත්‍රික්කයේ ප්‍රවේශ මාර්ග සඳහා රු.මි. 1766.94 ක වියදමින් ව්‍යාපෘති 2481 ක් සිදු කරමින් යටිතල පහසුකම් සංවර්ධනයට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. තව ද ග්‍රාමීය පාලම්, විදුලි ව්‍යාපෘති 33 ක්, සනීපාරක්ෂක ව්‍යාපෘති 158 ක්, ක්‍රීඩා පිටි 204 ක්, සුළු වාරි මාර්ග 53, සතිපොළ/ අලෙවි මධ්‍යස්ථාන/ ස්වයං රැකියා 255 ක්, ආගමික මධ්‍යස්ථාන සංවර්ධන ව්‍යාපෘති 784ක්, සමාජ සුභ සාධන ව්‍යාපෘති 520, නිවාස සංවර්ධන ව්‍යාපෘති 196 ක්, සූරිය පැනල ව්‍යාපෘති 132ක්, පානීය ජල ව්‍යාපෘති 22, නිල සෙවන ව්‍යාපෘති හා වෙනත් යටිතල පහසුකම් ව්‍යාපෘති සමඟින් සමස්ත දිස්ත්‍රික්කයම ආවරණය වන පරිදි ව්‍යාපෘති 5000 කට ආසන්න ප්‍රමාණයක් සිදු කරමින් දිස්ත්‍රික් සංවර්ධන කාර්යය පුළුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

තව ද සමෘද්ධි සංවර්ධන වැඩසටහන හරහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්, දිරිය පියස නිවාස වැඩසටහන්, සමෘද්ධි සහනාධාර ලබා දීම්, සමාජ සංවර්ධනයට අදාලව මත් නිවාරණ / සතුටු පවුල් වැඩසටහන්, කායික මානසික සංවර්ධන වැඩසටහන්, පුස්තකාල වැඩසටහන් ආදී වූ වැඩසටහන් හරහා මිලියන ගණනක් වැය කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට දායක වී ඇත.

විශේෂයෙන් සංවර්ධන කාර්යයන් ඉටු කිරීමේ දී මහජනයාගේ සවන්දීම ප්‍රමාණවත් ලෙස නොලැබීම, පැල්පත් හා අවිධිමත් ඉදි කිරීම් ඉවත් කිරීම සඳහා පිරිසගේ විරෝධය පලවීම හා ඔවුන් නිවැරදි ලෙස නිවාසගත කිරීමට ඇති අකමැත්ත මෙහි දී අභියෝග ලෙස අප මුහුණු දී ඇති ගැටළු ය.

නව නිවාස වැඩසටහන් තිරසර සංවර්ධනයේ වැදගත් ස්ථානයක් ලබා ගත්ත ද නිවාස ඉදිකිරීම සඳහා සුදුසු ඉඩකඩම් සොයා ගැනීම බලවත් ගැටළුවක්ව ඇත. එමෙන්ම නව තාක්ෂණය හා නවීන ක්‍රමවේදයන්ට අනුව කටයුතු කිරීමට ඇතැම් පිරිස්වල ඇති අකමැත්ත ද අඩු වැඩි වශයෙන් දැක ගත හැකිවේ.

ඉහත අභියෝගයන්ට මුහුණ දෙමින් වුව ද තිරසර සංවර්ධන ඉලක්ක සාධනය කර ගැනීම උදෙසා ආයතනයක් ලෙස ඉටු කළ කාර්යභාරය දිස්ත්‍රික් සංවර්ධනය සඳහා ඉවහල් වූ බව නොඅනුමානය.

මේ අනුව 2019 වර්ෂය තුල තිරසර සංවර්ධනය සඳහා විවිධ ව්‍යාපෘති යටතේ දායක වෙමින් තිරසර සංවර්ධන අරමුණු යථාර්ථයක් බවට පත් කර ගැනීමට අප කටයුතු කළෙමු.

6. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	16	15	01
තෘතීයික	4	3	1
ද්විතියික	82	74	8
ප්‍රාථමික	23	21	2

6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

ආයතනික කාර්ය සාධනය එම ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන්, ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් මත තීරණය වුව ත්, එම වැඩසටහන්, ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් මැනවින් පෙළගස්වමින් නියමිත කාල රාමුවක් යටතේ සුදුසු පරිදි කළමනාකරණය කොට සිදු නොකළහොත් කාර්ය සාධනය රටට අවශ්‍ය පරිදි සිදු නොවීමට ඉඩකඩ පවතී. නමුත් සිය ව්‍යාපෘති වැඩසටහන් හා ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී මානව සම්පත ඒ වෙනුවෙන් මැනවින් හසුරවමින් ඵලදායී ලෙස යොදා ගැනීම තුළින් බලාපොරොත්තු වන කාර්ය සාධන ඉලක්ක වෙත පහසුවෙන් ළඟා විය හැකි ය. නමුත් ආයතනයක් පවත්වා ගෙන යාමේදී එහි මානව සම්පතේ ගුණාත්මකභාවය මෙන්ම ප්‍රමාණාත්මකභාවය ද කාර්ය සාධනයට බෙහෙවින් ඉවහල් වේ. බොහෝ විට මානව සම්පත නියමිත ප්‍රමාණයට වඩා අඩුවෙන් සිටින අවස්ථා නිරීක්ෂණය වේ. ඇතැම් විට අතිරික්ත සේවක සංඛ්‍යාවක් ද පැවතිය හැක. කෙසේ වුව ද මානව සම්පතේ හිඟය හෝ අතිරික්තය කාර්ය සාධනය සඳහා ඍජු ලෙසම බලපාන බව නම් සැබෑ ය.

විශේෂයෙන් දැනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත තාක්ෂණ නිලධාරීන් සහ තාක්ෂණ සහයක නිලධාරීන් සේවයේ නියුක්තව සිටිය ද එම ප්‍රමාණය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂිකව කරනු ලබන විශාල ව්‍යාපෘති ප්‍රමාණයත් සමඟ ප්‍රමාණවත් නොවන බවක් දක්නට ලැබේ. මෙම තාක්ෂණ නිලධාරීන් සහ තාක්ෂණ සහයක නිලධාරීන් සීමිත වීම නිසා ව්‍යාපෘති වලට අදාල කාර්යයන් වන ව්‍යාපෘති අධීක්ෂණය, ඇස්තමේන්තු සැකසීම, ගෙවීම් කටයුතු ආදිය සිදු කරමින් කාර්යාලීය හා ක්ෂේත්‍රයේ කටයුතු සිදු කිරීමට සිදුවන බැවින් ව්‍යාපෘතිවල ගුණාත්මකභාවය පිළිබඳ නිසි තක්සේරුවක් දීමට ප්‍රමාණවත් කාලයක් යෙදවීමට නොහැකි තත්ත්වයක් උද්ගතව ඇත. එමෙන්ම එම නිලධාරීන් දරාගත නොහැකි පීඩනයකට ද පත්වේ. සත්‍ය වශයෙන්ම ව්‍යාපෘතියක් අවසන් කළ ද එය මහජනයාගේ භාවිතයට සුදුසු තරම් නොවේ නම් එහි කාර්ය සාධනයක් පවතීද යන්න ගැටළු සහගතය. එබැවින් මානව සම්පත් හිඟය කාර්ය සාධනයට ඍජු ලෙස බලපාන බවක් තාක්ෂණ නිලධාරීන් සහ තාක්ෂණ සහයක නිලධාරීන්

සම්බන්ධව විමසීමේ දී පැහැදිලි වේ. මෙම තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා එක් කොට්ඨාසයකට එම නිලධාරීන් 05 දෙනෙකුවත් යෙදවීමට හැකියාවක් පවතී නම් එය ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීමට හේතුවක් වේ.

තවද මෑත කාලීනව දිගින් දිගටම අභ්‍යාසලාභී උපාධිධාරීන් ලෙස විශාල ප්‍රමාණයකට රැකියා අවස්ථා ලබා දීම තුල එම නිලධාරීන්ට පැවරීමට තරම් ආයතනවල හා ක්ෂේත්‍රයේ රාජකාරි නොතිබීම ද ගැටළුවක් වී ඇත. ප්‍රයෝජනවත් වන අයුරින් නිලධාරින්ගේ දැනුම මට්ටමට සරිලන / ඔවුන් අධ්‍යාපනය කළ විෂය පථයන්ට සුදුසු ප්‍රමාණවත් රැකියා අවස්ථාවන් බිහි නොවීම තුල මෙම මානව සම්පත ඌණ උපයෝජනයට ලක් වී ඇත. හඳුනාගත් විධිමත් රාජකාරි පැවරීමක් මඟින් ඔවුන්ගේ දැනුම, කුසලතා කාර්යඵල දායකත්වය ලබා ගැනීමට නොහැකි වීම නිසා ආයතනයේ කාර්ය සාධනය උදෙසා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට ඇති අවස්ථා ද මඟ හැරී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරනු ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs.000)		වැඩසටහනේ ස්වභාවය	නිමැවුම / ලබාගත් දැනුම *
			දේශීය	විදේශීය		
<u>ප්‍රතිපාදන ලැබීම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය</u>						
පරිගණක භාවිතය දත්ත කළමනාකරණය හා විශ්ලේෂණ හැකියාව	133	දින 3 (වැඩමුළු 5)	356.25		දේශීය	එක් එක් මට්ටමේ අවම කාර්ය සාධනය පෙන්වන නිලධාරින්ගේ කාර්ය සාධනය වර්ධනය කර කාර්යක්ෂමතාවය හා ආයතනික ඵලදායිතාව ඉහළ නැංවීම ප්‍රමුඛ අරමුණ කර ගනිමින් අවශ්‍යතාවයට ගැලපෙන ලෙස උපරිම අයුරින් සිදු කරන ලදී.
ව්‍යාපෘති කළමනාකරණය	95	දින 2 (වැඩමුළු 2)			දේශීය	
රාජ්‍ය මූල්‍ය කළමනාකරණය	98	දින 3 (වැඩමුළු 2)			දේශීය	
රාජ්‍ය සේවයේ රියදුරකුගේ වගකීම	20	දින 10 (වැඩමුළු 1)			දේශීය	
කාර්යාල කාර්ය පටිපාටිය හා කාර්යාල ක්‍රම	46	දින 2 (වැඩමුළු 1)			දේශීය	
කාර්යාලීය උපකරණ භාවිතය, නඩත්තුව හා කාර්යාල කාර්ය සහයක වගකීම	23	දින 1 (වැඩමුළු 1)			දේශීය	
කාර්යාල ක්‍රම ප්‍රායෝගික භාවිතය	18	දින 1 (වැඩමුළු 1)			දේශීය	
පර්යේෂණ හා විශ්ලේෂණය	46	දින 2 (වැඩමුළු 1)			දේශීය	

<u>**ප්‍රතිපාදන ලැබීම් - අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**</u>						
සන්නිවේදන	87	දින 2 (වැඩමුළු 2)	760.84		දේශීය	එක් එක් මට්ටමේ අවම කාර්ය සාධනය පෙන්වන නිලධාරින්ගේ කාර්ය සාධනය වර්ධනය කර කාර්යක්ෂමතාව ය හා ආයතනික ඵලදායිතාව ඉහළ නැංවීම ප්‍රමුඛ අරමුණ කර ගනිමින් අවශ්‍යතාවයට ගැලපෙන ලෙස උපරිම අයුරින් සිදු කරන ලදී.
ව්‍යාපෘති කළමනාකරණය	82	දින 2 (වැඩමුළු 2)			දේශීය	
ආයතන සංග්‍රහයේ විධිවිධාන	142	දින 2 (වැඩමුළු 3)			දේශීය	
රාජ්‍ය මූල්‍ය කළමනාකරණය	129	දින 2 (වැඩමුළු 3)			දේශීය	
ඉසව් කළමනාකරණය	93	දින 2 (වැඩමුළු 3)			දේශීය	
පුද්ගල හා ආයතන සංවර්ධනය උදෙසා ඵලදායිතාව	166	දින 2 (වැඩමුළු 4)			දේශීය	
පරිගණක පුහුණුව - අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල	128	දින 3 (වැඩමුළු 6)			දේශීය	
පරිගණක පුහුණුව - (MS Excel)	131	දින 3 (වැඩමුළු 6)			දේශීය	
ආයතන ක්‍රම හා මහජන සම්බන්ධතාවය	42	දින 1 (වැඩමුළු 1)			දේශීය	
රාජ්‍ය සේවයේ රියදුරකුගේ කාර්යභාරය	30	දින 1 (වැඩමුළු 1)			දේශීය	
<u>**ප්‍රතිපාදන ලැබීම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**</u>						
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ 1 පන්තියට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වූ දින 10 පාඨමාලාව	76	දින 10 (වැඩමුළු 2)	222.03		දේශීය	අවශ්‍යතාවයට ගැලපෙන ලෙස උපරිම අයුරින් සිදු කරන ලදී.

ප්‍රතිපාදන ලැබීම් - සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව						
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි සංස්කෘතික නිලධාරින් සඳහා වූ පරිගණක පුහුණු වැඩසටහන	24	දින 10 (වැඩමුළු 1)	136.05		දේශීය	අවශ්‍යතාවයට ගැලපෙන ලෙස උපරිම අයුරින් සිදු කරන ලදී.
ප්‍රතිපාදන ලැබීම් - අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය						
චීනයේ පැවති Seminar on Construction & Management of Industrial Park Under the Belt & road Initiative for Sri Lanka පුහුණු වැඩසටහනට සහභාගි වීම	2	දින 22 (වැඩමුළු 1)	347.52		විදේශීය	කාර්ය සාධනය ඉහළ නැංවීම
පාකිස්ථානයේ පැවති National School of Public Policy (NSPP) පුහුණු වැඩසටහනට සහභාගි වීම	1	දින 13 (වැඩමුළු 2)	94.84		විදේශීය	කාර්ය සාධනය ඉහළ නැංවීම
මැලේසියාවේ පැවති International Best Practices in Public Finance Management Systems and Procedures පුහුණු වැඩසටහනට සහභාගී වීම	1	දින 7 (වැඩමුළු 1)	50.07		දේශීය	කාර්ය සාධනය ඉහළ නැංවීම

07 අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකට නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		

2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවකාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පන්තේ 40(4)ඉ උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම		ගර්හිත වාහන නැත	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම		අනුකූල නොවේ	මෝටර් රථ පරීක්ෂකගේ රාජකාරිමය හේතූන් මත ඉන්ධන පරීක්ෂාව සිදු කර ගැනීමට කටයුතු සලසා දී නොමැත
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම		අනුකූල නොවේ	කාල සීමාව ඉක්මවා ඇති වාහන නොමැත
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළැඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පත් සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත් කාර්ය අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය,භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		

15	**ආදායම් ගිණුම්**			
15.1	අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල නොවේ	ස්ථාන මාරු වීම් හා විශ්‍රාම යාම නිසා ඇති වන පුරප්පාඩු ක්ෂණිකව සම්පූර්ණ නොවීම	
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍ර ලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මත කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම් 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ	-	-
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ	-	-
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		